පළාත් මාර්ග ව්‍යාපෘතිය **- ඌව පළාත - 2013**

---------------------------------------------------

පළාත් මාර්ග ව්‍යාපෘතිය - ඌව පළාත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) අතර 2010 ජනවාරි 11 දින එළඹි අංක 4630 එල්කේ දරන ණය ගිවිසුමේ 4.09(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම,අරමුණු,අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------

පළාත් මාර්ග ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, ඌව, නැගෙනහිර හා උතුරු පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ වැඩිදියුණු කළ මාර්ග යටිතල පහසුකම් පිළිබඳ තිරසාර කළමනාකරණය මගින් ප්‍රතිග්‍රාහක ඌව, නැගෙනහිර හා උතුරු පළාත්වල සමාජ, ආර්ථික මධ්‍යස්ථාන සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ල ප්‍රකාරව, ව්‍යාපෘතියේ - ඌව පළාතේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 65.34 ක් වන අතර, ඉන් එ.ජ.ඩො. මිලියන 57.74 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.සං.සං) විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මාර්තු 31 දින ආරම්භ කරන ලද අතර, 2015 මාර්තු 31 දින වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

---------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂාකිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය,අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සළකණු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්,වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ). අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව,

(ආ). ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඇ). ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුනේ ද යන බව,

(ඇ). ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව,

(ඉ). ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව,

(ඊ). පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුනේ ද යන බව,

(උ). විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌණ පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේ ද යන බව, සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේ ද යන බව,

(ඌ). මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(එ). ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව,

**3.** **මතය**

**------**

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ). 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ). සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ). 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ). ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ). මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ගයක් ගෙන තිබූ බව සහ,

(ඊ). ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ව්‍යාපෘතියේ - ඌව පළාත සඳහා වියදම රු. 2,544,335,650 ක් වන අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 5,580,639,968 කි. සමාලෝචිත වර්ෂය සඳහා වියදම පෙර වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 1,617,209,664 | 786,063,771 | 3,873,907,575 |
| මාර්ග නඩත්තුව | 730,787,805 | 371,665,641 | 1,213,948,793 |
| උපදේශක සේවා | 175,418,612 | 111,029,406 | 422,302,057 |
| දේපළ, පිරියත හා උපකරණ | 74,524 | 5,204,710 | 10,934,395 |
| පුහුණුව හා වැඩමුළු | - | (294,000) | 100,000 |
| වර්ධක හා මෙහෙයුම් පිරිවැය | 20,845,045 | 18,005,123 | 59,447,148 |
| එකතුව | 2,544,335,650 | 1,291,674,651 | 5,580,639,968 |

**4.2 විශේෂ (ඩොලර්) ගිණුම**

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - ඌව පළාත, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - නැගෙනහිර පළාත සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - උතුරු පළාත සඳහා වෙන් වෙන් වශයෙන් විශේෂ (ඩොලර්) ගිණුම් 04 ක් විවෘත කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ඌව පළාත් විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 3,866,083.03 | 491,614,211 |
| <u>එකතු කළා</u> | | |
| ඌන පූර්ණයන් | 15,475,901.00 | 1,982,470,659 |
| විදේශ විනිමය වාසිය | - | 23,170,618 |
| | 19,341,984.03 | 2,497,255,488 |
| <u>අඩු කළා</u> | | |
| ආපසු ගැනීම් | 17,918,920.26 | 2,311,185,631 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,423,063.77 | 186,069,857 |

**5. විගණන නිරීක්ෂණ**

**නීති,රීති,රෙගුලාසි වලට අනුකූල නොවීම්**

ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ ඇමුණුම් 07 හි 29 හා 30 ඡේද අනුව අභ්‍යන්තර විගණන වාර්තා, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයට සහ ජා.සං.සං වෙත කාර්තුමය වශයෙන් ලබා දිය යුතු වුවත්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය ව්‍යාපෘතියේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**6.1 අරමුදල් උපයෝජනය**

අරමුදල් මූල්‍යනය, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - ඌව පළාත වෙත අයවැය ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට තත්වයට අදාල, වැදගත් සංඛ්‍යාලේඛන සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවය | අරමුදල් උපයෝජනය | | | | 2013 දෙසැම්බර් 31දින දක්වා උපයෝජනය කළ අරමුදල් | | 2013 දෙසැම්බර් 31දින දක්වා උපයෝජනය ප්‍රතිපාදන වලින් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|
| | මූල්‍යනය කිරීම සඳහා ණය ගිවිසුම අනුව එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2013 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | | | |
| | එජඩො මිලි. | රු. මිලි. | රු. මිලි. | රු. මිලි. | එජඩො මිලි. | රු. මිලි. | % |
| ජාසංසං | 57.74 | 7,542 | 2,339 | 2,311.18 | 42.47 | 5,207.19 | 69 |
| ශ්‍රීලංර | 7.60 | 950 | 279 | 233.15 | - | 373.44 | 32 |
| එකතුව | 65.34 | 8,492 | 2,618 | 2,544.33 | | 5,580.63 | 66 |

2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාලයෙන් සියයට 75 ක් ගතවීමෙන් පසු මුලු අරමුදල් වෙන්කිරීම් වලින් 66% ක් උපයෝජනය කර තිබු බව නිරීක්ෂණය විය.

## 6.2 භෞතික කාර්ය සාධනය

(අ). <u>පළාත් මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.</u>

ව්‍යාපෘති සක්‍යතා ලියවිල්ලට අනුව, ඌව පළාතේ දුර කිලෝමීටර් 117.06 ක් වු පළාත් මාර්ග හයක් රු. මිලියන 4,879 (VAT රහිතව) ක පිරිවැයක් දරමින් පුනරුත්ථාපනය කිරීමට බලාපොරොත්තු විය. කෙසේ වුවද, 2013 දෙසැම්බර් 31 දිනට දුර කිලෝමීටර් 82.51 ක් වු මාර්ග හතරක් සම්පූර්ණ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i). දුර කිලෝමීටර් 20.05 ක් වු ගලඋඩ - කන්දකැටිය - කිරිමැටිය (ඌව 02) මාර්ගය පුනරුත්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් 2010 නොවැම්බර් ලබා දී තිබුණ ද එම පුනරුත්ථාපන කටයුතුවල ප්‍රගතිය මන්දගාමී බවක් පෙන්නුම් කෙරේ.

(ii). ලබා ගත හැකි වු තොරතුරු අනුව කෝට්ටගොඩ - මස්පන්න - යාලගමුව (ඌව 01) මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු 2013 සැප්තැම්බර් 17 දිනට බොහෝදුරට සම්පූර්ණ කර තිබුණි. තවද, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

(ජාගොපසං) ව්‍යාපෘතියේ ඉල්ලීම මත 2013 සැප්තැම්බර් 25 දින මාර්ගයේ කිලෝමීටර් 1+860 සිට කිලෝමීටර් 15+ 750 දක්වා ස්ථානවල පරීක්ෂණ සිදු කර තිබුණි. ජාගොපසං නිර්දේශ අනුව, ස්ථාන දෙකක නව සමෝච්ච රේඛා මැනීම සහ අනෙක් ස්ථානවල බෑවුම් වෙනස්වීම මැනීම කල යුතු බවට නිර්දේශ කර තිබුණි. කෙසේ වුවත්, එම නිර්දේශයන් ක්‍රියාත්මක කල බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. තවද, 2014 අප්‍රේල් 22 සිදුකරන ලද විගණන ක්ෂේත්‍ර චාරිකාවේ දී එම මාර්ගයේ කිලෝමීටර් 20+000 ත් 23+ 420 ත් අතර අධික බෑවුම් සහිත කොටසේ විධිමත් කාණු පද්ධතියක් නොමැතිවීම මත මාර්ග පථය හානි වීමේ අවදානමක් පැවති බව නිරීක්ෂණය විය. වැසි කාලයට මාර්ග දෙපස සොදා ගොස් ඇත.

(iii). තවද, හග්ගල රෝඩ් - මැක්ඩොනල්ඩ් (ඌව 04) මාර්ගයේ කිලෝමීටර් 4+450 ස්ථානයේ ඉදිකරන ලද කාණුව පදිංචිකරුවන් බලහත්කාරයෙන් සම්පූර්ණයෙන්ම වසා දමා තිබූ අතර ඒ හේතුවෙන්, මාර්ගය සහ ආධාරක බැම්මට හානිවීමේ අවදානමක් පැවතුණි.

(iv). මැදිතලේ - කිරිවෙහෙර (ඌව 05) මාර්ගයේ කිලෝමීටර් 3+390 ස්ථානයේ රු. 3,052,719 ක පිරිවැයක් දරමින් ඉදිකරන ලද ආධාරක බැම්ම 2012 දෙසැම්බර් 17 දින සම්පූර්ණයෙන් හානිවී තිබුණි. මාර්ගයේ තත්වය ආරක්ෂාවීමට අදාල ආධාරක බැම්මේ පැවැත්ම තිරණාත්මක සාධකයක්ව තිබියදී කොන්ත්‍රාත්කරු මඟින් පවත්නා ආධාරක බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමට ක්‍රියාමාර්ගයක් ගැනීම වෙනුවට කොන්ත්‍රාත්කරුගෙන් ඉදිකිරිමට අදාල පිරිවැය පියවා ගැනීමට තීරණය කර තිබුණි.

(b). <u>දෛනික මාර්ග නඩත්තු කිරීම් සහ ඌව පළාත සඳහා මාර්ග නඩත්තු උපායමාර්ගයක් සංවර්ධනය කිරීම.</u>

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i). ලබාගත හැකි වූ තොරතුරු අනුව ඌව පළාතේ මාර්ගවල දෛනික නඩත්තු කටයුතු සඳහා එජඩො මිලියන 10 ක් වෙන්කර තිබුණු අතර මේ සංරචකය යටතේ කොන්ත්‍රාත් පැකේජ 76 ක් පිරිනමා තිබුණි. කෙසේ වුවද, මාර්ග නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීමේ ක්‍රමයක් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා දෛනික මාර්ග නඩත්තු කටයුතුවල භෞතික ප්‍රගතිය අගය කිරීමට නොහැකි විය.

(ii). ඌව පළාත සඳහා මාර්ග නඩත්තු කිරීම් උපායමාර්ගයක් සංවර්ධනය කිරීමේ කටයුතු 2013 දෙසැම්බර් 31 දින වන විටද සම්පූර්ණ කර නොතිබුණි.

**6.3 මතභේදයට තුඩුදෙන ස්වරූපයේ කරුණු**

---------------------------------------

ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රදේශීය කාර්යාලයන් හි නිළධාරීන් හත්දෙනෙකු සහ ඌව පළාත් සභාවේ මාර්ග අමාත්‍යාංශයේ ක්‍රමසම්පාදන නිළධාරියෙකු සඳහා ඉඩම් නිරවුල් කිරීම් සහ අනෙකුත් කාර්යයන්වලට සහභාගී වීම වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට දීමනා වශයෙන් එකතුව රු.852,226 ක් ගෙවා තිබුණි. තවද උපදේශකයකු සහ පාරිසරික නිළධාරියකු සමාන රාජකාරී කාර්යයන් කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් බඳවා ගෙන තිබුණි. දෙසැම්බර් 31 දිනට මාර්ග කිහිපයක පුනරුත්ථාපන කටයුතු සම්පූර්ණ කර තිබුණද සමහර නිළධාරීන් සඳහා දිගින් දිගටම දීමනා ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.